සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Province Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම
இரண்டாம் தவணை பதிப்பீடு - 2015
Second Term Evaluation

ශ්‍රේණිය தரம் Grade	විෂයය பாடம் Subject	පත්‍රය வினாத்தாள் Paper	පැය மணித்தியாலம் Hours
11	කතෝලික ධර්මය	I	01

සැලකිය යුතුයි:
(i) පළමු කොටසේ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
(ii) වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඔබට සපයා ඇති කොටු කොළයේ නියමිත කොටුවෙහි ලකුණ යොදන්න.
(iii) ඔබගේ පිළිතුරු පත්‍රයේ ඔබගේ විභාග අංකය හා විෂයයේ නම නිවැරදිව, පැහැදිලිව ලියන්න.

සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

(01) මැවීමේ පළමු කතාව හා මැවීමේ දෙවන කථාව අයත් වන සම්ප්‍රදායන් වන්නේ,
(1) පූජක හා එලොහිම් සම්ප්‍රදායට (2) යාවේ හා පූජක සම්ප්‍රදායට
(3) පූජක හා යාවේ සම්ප්‍රදායට (4) යාවේ හා එලොහිම් සම්ප්‍රදායට

(02) දෙවියන් වහන්සේ සමඟ සම්බන්ධ වීමෙන් මිනිසාට පූර්ණ නිදහස ලබා ගත හැකි බව ප්‍රකාශ කරනුයේ,
(1) ශුද්ධ වූ ජොහාන් තුමාය (2) ශුද්ධ වූ අන්තෝනි තුමාය.
(3) ශුද්ධ වූ අගුස්තිනු තුමාය (4) ශුද්ධ වූ අම්බ්‍රෝස් තුමාය.

(03) තම බිරිඳ තම සහෝදරිය බවට ප්‍රකාශ කරමින් තම ජීවිතය ආරක්ෂා කර ගනු ලබන්නේ,
(1) ඊසාක්ය (2) ආබ්‍රහම්ය (3) පිලිප්ය (4) දාවිත් ය

(04) "මම කිසිවක් නැතිව මව් කුසින් ආවෙමි. කිසිවක් නැතිව පෙරළා යන්නෙමි. සම්දාණෝ දුන් සේක. සම්දාණෝ ගත් සේක." මෙසේ පවසන්නේ,
(1) ආමෝස් ය (2) ජෝබ්ය (3) යෙසායාය (4) එසකියෙල්ය

(05) දුක් විඳීම හා එයින් ම මරණයට පත් වීමේ පරමාදර්ශය වූයේ,
(1) ස්නාවක ජුවාම්ය (2) ජුදාස්ය (3) පේදුරු ය (4) ක්‍රිස්තුන් වහන්සේ ය

(06) ශුද්ධ වූ සභාව ආරම්භ වූයේ,
(1) ස්වර්ගාරෝහණ දින ය (2) පාස්කු ඉරුදින ය
(3) පෙන්තකෝස්ත දින ය (4) ගොඩ ඉරුදිනය

(07) පෙරදිග හා අපරදිග වෙන් කළ බර්ලින් තාප්පය බිඳ දමා රට එක්සත් කිරීමට මුල් වූයේ,
(1) දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්ත්ම පියතුමා ය
(2) නැපෝලියන් අධිරාජ්‍යයා ය
(3) 16 වන බෙනඩික් ශුද්ධොත්තම පියතුමාය
(4) මැක්ෂි මිලියම් කෝල්බේ පියතුමාය

(08) " අප සමඟ ජීවත් වන සාන්තුවරිය" යන ආරුඪ නාමය ලබමින් මුළු ලොව ප්‍රසිද්ධ වූ තැනැත්තියකි.
(1) ආනා තුමිය (2) එළිසබෙත් තුමිය (3) මරිය තුමිය (4) තෙරේසා මව් තුමිය.

(09) "මරියතුමියගේ ශ්‍රී හෘදයේ හමුදාව" යන සංවිධානය ආරම්භ කරන ලද්දේ
(1) මැක්ෂි මිලියම් කෝල්බේ මුනිතුමා ය (2) වින්සන්ද පාවුලා මුනිතුමා ය
(3) ජුසේවාස් මුනිතුමා ය (4) අසීසියේ ශුද්ධ වූ ප්‍රැන්සිස් තුමා ය

(10) ශුද්ධ වූ පාවුළුතුමා පවසන පරිදි "ශුද්ධවූ සභාව" යනු,

(1) මීසම් සංඝයයි. (2) ක්‍රිස්තුන් වහන්සේගේ දේහයයි.

(3) දේව ජනතාවයි (4) දේව මන්දිරයයි.

(11) දුර්වල වන ශක්තිය නැවත ලබා දී මානසික සුවය ඇති කරන ප්‍රසාද නිධානයකි.

(1) අභිවෘද්ධි ආලේපය (2) ප්‍රසාද ස්නාපනය

(3) දිව්‍ය සන්ප්‍රසාදය (4) සමාව දීමේ ප්‍රසාද නිධානය

(12) ආබ්‍රහම් ඊසාක් හා ජාකොබ් සමඟ දෙවියන් වහන්සේ ගිවිසුම් සබඳතාව ..... සේක.

(1) පූර්ණත්වයට පත් කළ (2) වෙනස් කළ

(3) අළුත් කළ (4) සම්පූර්ණ කළ

(13) ඊශ්‍රායෙල් සෙනඟ ශුද්ධ වූ ජනතාවක්, කැපවූ ජාතියක් හා දේව ආදරය විශේෂයෙන් ලද පිරිසක් බවට පත් වූයේ,

(1) දිවැසිවරුන්ගේ ප්‍රකාශන මඟිනි (2) මෝසෙස් සමඟ කළ ගිවිසුමෙනි

(3) නෝවා සමඟ කළ ගිවිසුමෙනි (4) ආබ්‍රහම් සමඟ කළ ගිවිසුමෙනි

(14) අනෙකුත් මැවිලි අතරින් මනුෂ්‍යයා උසස් යැයි සැලකෙන්නේ ඔහු තුළ ඇති,

(1) ඉවසීම හා පරිත්‍යාගය නිසාය (2) ප්‍රේමය හා විශ්වාසය නිසාය

(3) ආත්මය හෙවත් ස්ප්‍රිතුව නිසාය (4) ආදරය හා කරුණාව නිසාය.

(15) " දිළිඳුන්ට සුබ ආරංචිය දේශනා කරනු වස් උන්වහන්සේ මා ආලේප කළ සේක." මෙහි සඳහන් ආලේප කළ තැනැත්තා වනුයේ,

(1) ස්නාවක ජුවාම් තුමා ය (2) ජේසුස් වන්සේ ය

(3) ජෙරමියා දිවැසිවරයා ය (4) මෙල්කිසදෙක් පූජක තුමාය

(16) දෙවියන් වහන්සේට ප්‍රසන්න වන එකම යාගය

(1) ඊසාක් යාග කිරීමයි (2) පේදුරු තුමාගේ යාගයයි

(3) කායින් හා ආබෙල්ගේ යාගයයි. (4) ක්‍රිස්තුන් වහන්සේගේ යාගයයි.

(17) තමා සන්තක සියල්ල අහිමි වුවත් දෙවියන් වහන්සේට ප්‍රශංසා කළේ,

(1) ජෝබ් ය (2) ආබ්‍රහම්ය (3) නෝවාය (4) මෝසෙස්ය

(18) ක්‍රිස්තුන් වහන්සේ ජාති, ආගම්, කුල නොසලකන බවට උදාරහරණකි.

(1) කානා නුවර මංගල්‍යයට සහභාගී වීම (2) ස්නාවක ජුවාම්ගෙන් බෞතිස්මය ලැබීම

(3) සමාරිය ස්ත්‍රියගෙන් ජලය ඉල්ලීම (4) මාර්තා හා මරියාගේ නිවසට යාම

(19) "....." යනු තාපස ජනපද හැදින්වූ නාමයයි. මෙහි හිස්තැනට සුදුසු වචනය වන්නේ,

(1) කැටකුම්බ (2) ලම්රා (3) ධර්මශාලා (4) සිනගෝග

(20) ආත්මාර්ථකාමී බවින්, උඩඟුකමින් හා බලයෙන් නිදහස් වීම පැහැදිලි කිරීම පිළිබඳ ප්‍රබල සාධකයකි.

(1) ගෝලයන්ගේ පාද දෝවනය කිරීම (2) විනයධරයන්ට තරවටු කිරීම

(3) දේව මාලිගයේ වෙළඳුන් පන්නා දැමීම (4) සක්වුස්ගේ නිවසට යාම

(21) " මනුෂ්‍යයා මෙලොව ජීවිතයේදී මෙන් ම මතු ජීවිතයේ දී ද සතුටින් ජීවත් වීම දෙවියන් වහන්සේට ප්‍රශංසාවකි" මෙසේ පවසන්නේ,

(1) සාන්ත ඉරනේයස් තුමා ය (2) ශුද්ධ වූ පාවුළු තුමාය

(3) ශාන්ත අම්බ්‍රෝස් තුමා ය (4) ස්නාවක ජුවාම් තුමා ය

(22) දේව වචනය තුළ ජීවිතය අර්ථවත් කර ගැනීමට නම් අප නිතරම,

(1) දිව්‍ය පූජාවට සහභාගි විය යුතුය
(2) දේව වචනය ජීවිත අත්දැකීමක් කර ගත යුතුය
(3) ශුද්ධ බයිබලය කියවිය යුතුය
(4) දහම් පාසලේ ඉගැන්විය යුතු ය

(23) සාකච්ඡා කිරීම ⟶ සම්බන්ධතාව ඇති කිරීම ⟶ නතර වීම ⟶ පූජය බෙදා ගැනීම යන අවස්ථාවන් හා සම්බන්ධ ප්‍රධාන සිද්ධිය වන්නේ,

(1) කන්ද උඩ දේශනයයි
(2) අන්‍ය රූප විලාශ වූ අවස්ථාවයි
(3) එම්මාවුස් ගමනයි
(4) අන්තිම රාත්‍රී භෝජනයයි

(24) " පරලෝකේ මන්නාවෙනී, ජීවිත දායකයෙනි" මෙම ගීතිකාවේන් ප්‍රකාශ වන්නේ,

(1) මන්නා පිළිබඳවයි
(2) දෘශ්‍යමී ජීවිතයයි
(3) දිව්‍ය සත්ප්‍රසාදයයි
(4) ස්වර්ග රාජ්‍යයි

(25) "ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න. ඔබට පීඩා කරන්නන් උදෙසා ....." මෙහි හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,

(1) වෛර කරන්න. (2) ප්‍රේම කරන්න (3) යහපත කරන්න (4) යාච්ඤා කරන්න

(26) දෙවියන් වහන්සේට පඬුරු ඔප්පු කරනවාට වඩා වැදගත් වනුයේ,

(1) යහපත් ජීවිතයක් ගත කිරීමයි
(2) සහෝදරයා සමඟ සම්බන්ධ වීමයි
(3) දිළිඳු වූ අයට දන් දීමයි
(4) දිව්‍ය පූජාවට සහභාගි වීමයි

(27) ගෝලයන් සමඟ බෙදාගත් පූජකවරයේ කාර්ය භාරය වර්තමානයේ සිදු කරනු ලබන්නේ,

(1) පූජා ප්‍රසාදිවරු, රාජගුරු ප්‍රසාදිවරු හා තේවාචාර්යවරුන් විසිනි.
(2) පූජා ප්‍රසාදිවරු, පැවිදි සොයුරියන් හා ගිහි ජනතාව විසිනි
(3) රාජගුරු ප්‍රසාදිවරු, පූජාප්‍රාසාදිවරු හා කිතුනු ජනතාව විසිනි
(4) රාජගුරු ප්‍රසාදිවරු,ශුද්ධ වූ සභාව හා ලෝකවාසින් විසිනි

(28) සැබෑ සාමය ඇති කිරීමට නම් අප නිතරම,

(1) මානව ගරුත්වයෙන් පොදු යහපත අගය කළ යුතුය
(2) ඉවසීමෙන් හා නිර්හිත කමින් කටයුතු කළ යුතුය
(3) දිළිඳු කමින් හා ඉවසීමෙන් කටයුතු කළ යුතුය
(4) යුක්තිය හා සාධාරණත්වයෙන් කටයුතු කළ යුතුය

(29) සැබෑ කිතුනුවකු ලෙස සමාජය තුළ සාක්ෂි දරීමට නම් අප

(1) සමිති සමාගම් වලට සම්බන්ධ විය යුතුය
(2) රාජ්‍ය ප්‍රතිපත්ති වලට ගරු කළ යුතුය
(3) රටේ පවතින නීතියට යටත් විය යුතුය
(4) පොළවේ ලුණු මෙන් රසවත් විය යුතුය

(30) අප සතු සම්පත් අන් අය සමඟ බෙදා ගැනීමෙන්,

(1) වත්කම් ප්‍රකාශ කළ හැකිය
(2) සහෝදරත්වය ප්‍රකාශ කළ හැකි ය
(2) යුතුකම් ඉටු කළ හැකිය
(4) බොහෝ සතුටු විය හැකිය

(31) වර්තමාන මිනිසා පරිණාමය වන්නේ කවර අංශ වලින් ද?

(1) විද්වතුන්ගේ පරිණාමීය සලකුණු මගින් ය.
(2) විශ්වයේ මූලාරම්භය හා ඉලක්ක තොරතුරු මගින් ය
(3) මිනිසාගේ දැනුමෙන් හා හැකියාවෙන් ය
(4) මිනිසා තුළ පවතින විශ්වාසය හා සත්‍යතාව මතය.

පහත කරුණු උපයෝගි කර ගනිමින් 32, 33, 34 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A ප්‍රසාද ස්නාපනය
B අභිවෘද්ධි ආලේපය
C දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ
D සමගි වීමේ ප්‍රසාද නිධානය
E ආශීර්වාදකාර බන්ධනය
F පූජකවරය
G සුවදානයේ ප්‍රසාද නිධානය

(32) ආරම්භක ප්‍රසාද නිධාන ලෙස නම් කරන්නේ,

(1) A,B හා C ය. (2) B,C හා D ය. (3) C,D හා E ය. (4) D,E හා F ය.

(33) සමාජ සේවය සඳහා යොමු වූ ප්‍රසාද නිධාන වන්නේ,

(1) A හා B (2) C හා D (3) A හා G (4) E හා F

(34) එක වරක් පමණක් ලබා ගත හැකි ප්‍රසාද නිධාන වන්නේ,

(1) A,B හා C ය. (2) A,B හා D ය. (3) A,B හා E ය. (4) A,B හා F ය.

(35) '' මා හැර කිසිම දෙවි කෙනෙකු නුඹට නොසිටිය යුතු ය.''

ඉහත වගන්තියට අදාල පනත වන්නේ,

(1) දෙවන පනත (2) පළමු පනත (3) හතරවන පනත. (4) හත්වන පනත

(36) '' මෙන්න මා මෙහිය මා යැව්ව මැනව'' යනුවෙන් තම දේව කැඳවීමට පිළිතුරු දුන් දිවැසිවරයා වන්නේ,

(1) යෙසායා ය (2)ආමෝස්ය (3)මීකා ය (4) ජෙරමියා ය

(37) පහත සඳහන් වන්නේ ශුද්ධාත්ම ඵල හා දිමනා කිපයකි. මේ අතුරින් ශුද්ධාත්ම ඵල පමණක් සඳහන් වන්නේ,

(අ) ප්‍රේමය, ප්‍රඥාව, ඉවසීම, ධෛර්යය

(ආ) ප්‍රේමය, ප්‍රීතිය, ඉවසීම, කරුණාව

(ඉ) යහපත්කම, දැනගැන්ම, මෘදුකම, තේරුම් ගැනීම

(ඊ) මෘදුකම, ආත්ම දමනය, සාමය, විශ්වාසවන්ත කම

(1) (අ) හා (ආ) ය (2) (ඉ) හා (ඊ) ය (3) (ආ) හා (ඊ) (4) (ආ) හා (ඉ)

(38) ආශීර්වාදකාර බන්ධනය නැමැති දේව ප්‍රසාද නිධානය දානය කරනු ලබන්නේ,

(1) මනාල යුවළ එකිනෙකාට ය (2) පූජා ප්‍රසාදි තුමා ය

(3) මංගල දිව්‍ය පූජාවට පැමිණි පිරිස ය (4) රදගුරු තුමාය

(39) මිසමේ පියතුමාට පැවරෙන කාර්යයන්ගෙන් එකකි.

(1) ශ්‍ර. සභාවේ සංස්කෘතික ලක්ෂණ වලට පමණක් මුල් තැනදීම

(2) අන්‍යාගමිකයන්ගේ සුවදුක් බැලීම

(3) තම තිරණ පමණක් මිසම තුළ ක්‍රියාත්මක කිරීම

(4) මිසමේ අසරණ පවුල් බැහැදැකීම

(40) සත්‍යය හා සාධාරණත්වය පදනම් කර ගත් සමාජයක් කරා යන ගමනේ දී අප ජීවිත සකස් කර ගැනීමට ප්‍රබල අවියක් වන්නේ ..... බව ශුද්ධ ලියවිල්ල පැහැදිලි කරයි. හිස්තැනට වඩාත් ගැලපෙන වචනය වන්නේ,

(1) දසපණත (2) ප්‍රසාද නිධාන (3) යාච්ඤාව (4) ජීවිත ආදර්ශය

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Province Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම
இரண்டாம் தவணை பதிப்பீடு - 2015
Second Term Evaluation

ශ්‍රේණිය தரம் Grade	11	විෂයය பாடம் Subject	කතෝලික ධර්මය	පත්‍රය வினாத்தாள் Paper	II	පැය மணித்தியாலம் Hours	02

සැලකිය යුතුයි:

(i) ඔබ පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(ii) දෙවන කොටසේ පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්‍යය වේ.

(iii) පළමු වන ප්‍රශ්නයට සහ තවත් ඔබ කැමති වෙනත් ඕනෑම ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

(iv) ඔබගේ පිළිතුරු පත්‍රයේ ඔබගේ නම, විභාග අංකය හා විෂයයේ නම නිවැරදිව පැහැදිලිව ලියන්න.

---

(01) ප්‍රශ්න සියල්ලට කෙටි පිළිතුරු ලියන්න.

(1) මංගලී කිමේ දී මරිය තුමිය විසින් දේව දූතයාට කුමක් පවසන ලදී ද?

(2) දේව පුත්‍ර භාවය අනාවරණය වූ අවස්ථා දෙකක් නම් කරන්න

(3) ශූ. මතෙව් තුමා පවසන මංගල වාක්‍ය දෙකක් ලියන්න.

(4) පෘතුගීසි ධර්මදූත සේවය මෙරට සාර්ථක වීමට බලපෑ හේතු දෙකක් ලියන්න.

(5) " ස්වාමිනි, චතුර කැළඹෙන විට මා පොකුණට බස්ස වන්නට කිසිවෙක් නැත." මෙම ප්‍රකාශය කරනු ලබන්නේ කවුරුන් විසින් කා හට ද?

(6) ආදී පියවරුන්, වීරවරුන් හා දිවැසිවරුන් මගින් දෙවියන් වහන්සේ ජනතාවට අනාවරණය කළේ කුමක් ද?

(7) ජේසුස් වහන්සේ අන්තිම රාත්‍රී භෝජනය අවස්ථාවේදී මිදියුම පාත්‍රය රැගෙන පැවසූ වදන් ලියා දක්වන්න

(8) මනුෂ්‍ය පුත්‍රයාණන්ට පවු කමා කිරීමේ බලය ඇති බව පෙන්වීම සඳහා සිදු කළ ප්‍රාතිහාර්යයන් දෙකක් නම් කරන්න.

(9) ජේසුස් වහන්සේගේ උත්ථානය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(10) පැරණි ගිවිසුමේ පුජකවරු ජනතාව වෙනුවෙන් ඉටු කළ යුතුකම් දෙකක් සඳහන් කරන්න

(ලකුණු 2 × 10 = 20)

(02) (1) ශුද්ධවූ පාවුළු තුමා කොරෙන්ති වරුන්ට ලියූ පළමු හසුනට අනුව ශරීර දෙවර්ගය නම් කරන්න. (ලකුණු 02)

(2) දේව සමාන කම කරුණු තුනකින් ඉදිරිපත් කරන්න. (ලකුණු 03)

(3) බිඳ වැටුනු දෙව් මිනිස් සබඳතාව ගොඩ නගා ගැනීම සඳහා කළ හැකි ක්‍රියාවන් පහක් ලියන්න. (ලකුණු05)

(03) (1) මාංශ ගත වීම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)

(2) ශුද්ධාත්මයාණන් වෙතින් ලැබෙන අධ්‍යාත්මික දීමනා තුනක් ලියන්න (ලකුණු 03)

(3) අභිවෘද්ධි ආලේපය ලබා සිටින ඔබ සභාවේ වැඩිහිටියකු ලෙස ක්‍රියා කරන ආකාරය කරුණු පහකින් ලියා දක්වන්න. (ලකුණු 05)

(04) (1) නව ගිවිසුම තුළ දේව අනාවරණය සිදු වූ මාර්ග දෙකක් සඳහන් කරන්න (ලකුණු02)

(2) දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ සම්පූර්ණ ප්‍රතිරූපය ක්‍රිස්තුන් වහන්සේ තුළ ඉදිරිපත් කළ බවට උදාහරණ තුනක් දක්වන්න. (ලකුණු 03)

(3) එදිනෙදා සිදුවීම් තුල දෙවියන් වහන්සේ ඔබ අත්දුටු අවස්ථා පහක් ලියන්න. (ලකුණු 05)

(05) (1) ශ්‍රී ලංකීය සංස්කෘතිය තුළ බිහි වූ දේශීය කණ්ඩායම් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) ලන්දේසීන් විසින් කතෝලිකයන්ට ඇති කළ පීඩන ප්‍රතිපත්ති තුනක් ඉදිරිපත් කරන්න. (ලකුණු 03)

(3) ජූසේ වාස් පියතුමාගේ ජීවිතයෙන් ඔබගේ ජීවිතයට ගත හැකි ආදර්ශ පහක් ලියන්න. (ලකුණු 05)

(06) (1) විවාහ බන්ධනයේ ස්ථාවරත්වය පිළිබඳව සඳහන් වන ශුද්ධ ලියවිලි පාඨය ලියා දක්වන්න. (ලකුණු 02)

(2) ආශීර්වාකාර බන්ධනයේ ප්‍රසාද නිධානය ලබා ගැනීමේදී දෙනු ලබන පොරොන්දු තුන ලියන්න. (ලකුණු 03)

(3) විවාහ දිවියට ඇතුළත් වූ යුවලක් විසින් ජීවිතාන්තය දක්වාම සුරැකිය යුතු කරුණු 5 ක් ලියා දක්වන්න.

(ලකුණු 05)

(07) පහත සඳහන් මාතෘකා අතරින් ඔබ කැමති ඕනෑම දෙකක් තෝරා කෙටි සටහන් ඉදිරිපත් කරන්න.

(1) පෙරමඟ සුදානම් කරන්නා

(2) තෙරේසා මව් තුමිය

(3) ධර්මදූත ළමා සමාජය

(4) දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටු විය යුතු යුතුකම්

(5) මෝසෙස්ගේ කැදවීම

(ලකුණු 5 × 2 = 10)

The National e-learning Portal for The General Education